**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර සඳහා පුරප්පාඩු පිරිවීම

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) HM 1-1 "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" සේවා ගණය - තනතුරු 01 කි

### සුදුසුකම්

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලන හෝ වාණිජ්‍ය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**සමඟ**

ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් කළමනාකරණ ආයතනයේ (CMA) හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (CA) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිලත් කළමනාකරණ ආයතනයේ (CMA) හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) අධි සාමාජිකත්වය ලබා තිබීම.

**සමඟ**

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකර (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියේ මූල්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප** : HM 1-1 - රු.80,295 - 15x2,270 = 114,345

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- ඉන්ධන දීමනාව සමඟ තිල රථයක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් ලැබෙනු ඇත
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

**වයස** : අවුරුදු 35ට නො අඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

- මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද, සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
- අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
- අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

**අයදුම් කළ යුතු ආකාරය**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරට බඳවා ගැනීම** යනුවෙන් සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2024.02.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ hr@cma.lk දරන email (විද්‍යුත් තැපැල) ලිපිනයට එවිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 2.**